

# ඩීබී සහ මම 2

**ජගත් ජේ එදිරිසිංහ**

ඩී බී ගේ ජීවිතයේ මා දුටු උත්තම ලක්ෂණය තමාත් සමග ඉදිරියට යන පරපුරක් ගොඩනගා ගන්නට ඔහුට තිබූ උනන්දුව සහ ඒ වෙනුවෙන් දැරූ උත්සාහයයි. ඒ පිලිබඳ උදාහරණ ඕනෑ තරම්ය.

අපි 2003 අප්‍රේල් මාසයේදී පහන සගරාව ආරම්භ කළෙමු. ඩීබී එහි වැදගත් කොටස්කාරයකු විය. පහන මෙහෙයවීමෙන් සාහිත්‍ය තරගාවලියක් පවත්වන්නට අපට අවශ්‍ය විය. යෝජනාව ඉදිරිපත් වූ තැන් සිට ඩීබී ඉතා උනන්දුවෙන් ඒ වෙනුවෙන් මහන්සි වූ ආකාරය මට අද ද මතක ය. කෙටිකතා සහ කවි යන අංශ දෙකෙන් පැවැත්වූ තරගාවලියට අප ලද නිර්මාණ විනිශ්චය කරන්නට පමණක් නොව ජයග්‍රාහක ජයග්‍රාහිකාවන් සමග සම්බන්ධතා ඇති කරගන්නටත් ඔහු වෙහෙස විය. තරගාවලිය හරහා අප හඳුනාගත් ලේඛක ලේඛිකාවන් ඉදිරියට ගන්නට ඔහුට මහත් ඕනෑකමක් විය.

ආචාර්ය විද්‍යානි මනතුංග, හේමමාලා හේරත් වැනි ලේඛිකාවන් ඔහුගේ වැඩි අවධානයක් දිනාගත් බව මට මතක ය. විද්‍යානි කැන්බරා සිට සිය පවුලම සමගින් කුරුප්පු මහත්තයාගේ අවසන් මොහොතට පැමිණ සිටියේ ඒ කෘතවේදීත්වයට බව මම දනිමි.

"මේ ළමය හරිම දක්ෂ විදිහට ලියනවනෙ ජගත්... අපි එයාව ඉස්සරහට ගන්න ඕනෙ" ආධුනික ලේඛක ලේඛිකාවන් සම්බන්ධයෙන් ඔහු කී වතාවක් නම් මා සමග කියා ඇත්ද?

ඔස්ට්‍රේලියාවේ සිට සිංහලෙන් ලියන සියලූම ලේඛක ලේඛිකාවන් පිළිබඳ විස්තර ඔහු රැස්කරගෙන සිටියේය. මේ විගාමික ලේඛක ලේඛිකාවන් කෙරෙහි මව්බිමේ සිටින සාහිත්‍යවේදීන් කිසිදු අවධානයක් යොමු නොකරන්නේ යයි ඔහු නිතරම මැසිවිලි නැගුවේ ය. කෝප ගත්තේ ය. ඒ ගැන ලිව්වේ ය.

"අන්න අහවල් ලේඛකයා ලංකාවෙ ඉඳන් ඇවිත් මෙල්බන් වල බුක් ලෝන්ච් එකක් කරන්න යනවා... ඔයාට කතා කළා ද?" ඔහු වරෙක අසයි.

එහෙම එන බොහෝ ලේඛකයන් අපට කතා කරන්නේ නැත. අප ඉන්නා බවක් වත් ඔවුන් දන්නේ නැත. බොහෝ විට එවැනි පොත් එළිදැක්වීමක් මේ දේශයේ සිදුවූ බව අප දැනගන්නේ ලංකාවේ පත්තරයක ඒ බව පළ වූ විට ය. ලංකාවේ පම්පෝරිය ගසන්නේ සමස්ථ ඕස්ට්‍රේලියාවම සහභාගි වූ පොත් එළිදැක්වීමක් හැටියට ය. මේ මිනිසුන් කෙරෙහි ඩීබීගේ සිතේ තිබුණේ පුදුමාකාර අප්‍රසාදයකි.

"මෙහෙ ඉඳන් ලියන එක මිනිහෙක් ගැන වචනයක් ලියන්නෙ නැති එවුන් මෙහෙ කාව හරි අල්ලගෙන මෙහෙ ඇවිත් සන්දර්ශන දාලා යන එක තමයි මට ඉවසන්න බැරි..." ඔහු කීපවතාවක් ඒ අදහස මා සමග කීවේ ය. කීවා පමණක් නොව එවැනි සන්දර්ශනකාර ලේඛකයන් ගැන සැර ලිපි ද ලිව්වේ ය. එවන් ලිපියක් පළකිරීමෙන් හිත රිදවාගත් අයෙක් අපට නඩු දමන්නටද සැරසුණාහ. අපට කාගේවත් හිත් රිදවන්නට අවශ්‍යතාවක් නොවූ බැවින් "පහන" වෙනුවෙන් බන්දු දිසානායකත් "සන්නස" වෙනුවෙන් මාත් පාදයක් පසුපසට ගෙන ආරක්ෂාකාරී පහර එල්ල කළත් කුරුප්පු මහත්තයාට ඕනෑ වුයේම හයේ පාරවල් ගහන්නටම ය.

"මුං මෙහේ ඉන්න එක ලේඛකයෙකුටවත් ආරාධනා කරන්නෙ නැතුව මෙහෙ ඇවිත් පොත් එළිදැක්වීම් කරලා ගිහින් ලංකාවේ පත්තරවල පම්පෝරි ගහනවා... ඔය එකෙකුටවත් මං බය නෑ.. මං නඩු කියන්න ලෑස්තියි.. මා එක්ක නඩු කිව්ව දවසට තමයි උං ඉගෙන ගන්නෙ.." ඔහු ආවේගවත්ව කියයි. ඩීබී යකාටවත් බය නැත. වයසට ගියත් ඔහු තරුණය.

2006 අවුරුද්දේ සන්නස පුවත්පත් ඔස්සේ අප පැවැත්වූ කෙටිකතා තරගාවලියටද ඩීබී ගෙන් ලද සහය අපමණ විය. අවසාන වටයට තේරෙන කෙටිකතා දහය පොතක් ලෙස මුද්‍රණය කරන්නට අපි කතිකා කරගෙන සිටියෙමු. පොත සකස් කළත් ලංකාවේ මුද්‍රණය කළත් එය ඔස්ට්‍රේලියාවට ගෙන්වාගන්නට තරම් මුදලක් අප අතේ නොවී ය. සන්නසේ අප මුදල් හම්බ කරන අය නොවූ නිසා ය. වැඩේ පමා වන විට නොසන්සුන් වූයේ කුරුප්පු මහත්තයා ය. ඔහු වරින් වර දුරකතන ඇමතුම් දෙමින් ප්‍රමාදය ගැන විමසනවිට ඇත්ත නොකියා සිටින්නට මට නොහැකි විය.

"ඇයි ඉතින් ඕක කලින් නොකීවෙ?" ඔහු ඇසුවේ ය. "මං සල්ලි දෙන්නම්.. පොත් ටික ගෙන්නගෙන උත්සවේ තියන්න.."

සන්නස කෙටිකතා තරගාවලියේ අවසන් කෙටිකතා දහය ඇතුල්කර මුද්‍රණය කළ " පළමුවැනි තෑග්ග" කෙටිකතා සංග්‍රහය ඔස්ට්‍රේලියාවට සැපත් වූයේ ඩීබී කුරුප්පු මහතා දුන් මුදලින්ය යන්න බොහෝ දෙනෙක් නොදැන සිටියේ ඒ බව හෙළි කිරීම අපට තහනම් කොට තිබූ හෙයිනි. ආණ්ඩුවෙන් ලැබෙන මුදලින් සහ හිතවතුන්ගේ සහයෝගයෙන් ජීවිතය ගැටගසාගත් ඩීබී අලූත් පරපුරක් ඉදිරියට ගන්නට තමන් අත තිබූ තුට්ටුදෙක වියදම් කරන්නට පසුබට නොවී ය.

ඩීබී හා බැඳුන කතා  අපමණය. ඒවායින් එකක් මේ සටහනටම ලියන්නට මට සිතෙයි.

ඩීබී ද්විභාෂා උගතෙකි. සිංහල ඉංගිරිසි දෙබසම ව්‍යක්ත ලෙස හසුරුවන්නට ඔහුට හැකියාව තිබුණි. පහනට ඔහු ඉංගිරිසි ලිපිය ලීවේ බැදරුදද යන ආරූඪ නමිනි. සන්නසට ඉංගිරිසි ලිපිය ලිව්වේ ඔයැ ඈැෙප්එදර යන නමිනි. පහනෙන් පසු සන්නස ආරම්භ කළ යුගයේ මගේ අතින් වරදක් සිදුවිය. ඒ වන විටත් පහන මානසිකත්වයෙන් සිටි මම සන්නසට ඩීබී ලියූ ඉංගිරිසි ලිපියට රචකයාගේ නම බැදරුදද ලෙස යෙදුවෙමි. හිතාමතා කළ දෙයක් නොවේ. පෙර පුරුද්දට සිදුවූ අත්වැරුද්දකි.

ඩීබී ට අසූහාරදාහට කේන්ති ගියේය.

"මේක හිතා මතා කළ දෙයක්.. මේකෙන් මේ ලිපිය ලියන්නෙ කවුද කියල එළිදරව්වෙනවා.. මං ආයෙ සන්නසට ලියන්නෙ නෑ.." ඩීබී කෝපයෙන් කෑගැසුවේ ය. ඒ කේන්තියෙන්ම ඔහු සන්නසට ලිපි ලිවීම නැවැත්තුවේ ය. මම මාස දෙකක් පමණ දහ අතේ කනිපින්දම් ගසමින් සිදුවුණ වරදට සමාව ඉල්ලමින් ඔහු පස්සේ ගියෙමි.

මාස දෙකක් පමණ යන විට ඔහුගේ හිත ලිහිල් විය.

"ඔන්න මම ලිපියක් තැපැල් කළා" ඔහු එක් දිනක් දුරකතනයෙන් කීවේ ය. මම සතුටින් පිනා ගියෙමි.

කොච්චර කේන්ති ගියත් ඩීබී කියන්නේ හිත හොඳ මිනිහෙකි.

## අගැයුමක් නොලද ලේඛකයා

ඩීබී ගේ අවමංගල උත්සවයෙන් පසු චාරිත්‍රාණුකූල මළ බතට සහභාගි වූ අපි වරුණ සාවින්දගේ නිවසෙට එක්වුණෙමු. අපි යයි කීවේ කල්පනා ඇම්බ්‍රෝස්, දිළිණි ඊරියවල, නිරාශ ගුණසේකර, මාලන් බණ්ඩාර කපුවත්ත,  චතු පත්බේරිය සහ මට ය. තරුණ කවියනට කිවිඳියනට ඩීබී ගැන කතා කරන්නට එසේත් නොවේ නම් ඩීබී ගේ නිර්මාණ ගැන ආවර්ජනයක යෙදෙන්නට අවශ්‍යව තිබුණි. ඔවුන්ගේ කතා බහේ දී මතුවුණ ප්‍රධාන කාරණය වුයේ ස්වතන්ත්‍ර නිර්මාණකාරයකු ලෙස ඩීබී සාර්ථක ද යන්නය.

ඩීබී ලියූ එකම නවකතාව "එක්තරා ප්‍රේම කතාවක්" ය. කෙටි නමුත් එය හොඳ නවකතාවක්ය යන්න මගේ පිළිගැනීමයි. එයට අමතරව ඔහු ලියූ "විප්ලවය ආවොත්" "කලු හිල සහ නාරා වල" වැනි කෙටිකතා සංග්‍රහ කීපයක්ම වෙයි.

ස්වතන්ත්‍ර කෙටිකතාකරුවකු ලෙස ඩීබී සාර්ථක නොවූ බව මම ද පිළිගනිමි. එහෙත් ඒ සමගම ඩීබී කුරුප්පු නම් වන පරිවර්තකයා ලංකාවේ කිසිදු පරිවර්තකයකුට දෙවෙනි නොවන බවද මගේ පිළිගැනීමයි. "දැත්තගෙයි යාළුවන්ගෙයි හපන්කම්" "මැංචෝසන්ගේ චාරිකා" වැනි පරිවර්තන වලින් ඇරඹුණ ඩීබී කුරුප්පු නම් වන පරිවර්තකයාගේ ගමන් මග ඉතා ආශ්වාද ජනක එකක් බව මට වඩාත් පසක් වන්නේ ඔහුගේ මරණයෙන් පසුව ඔහුගේ පරිවර්තන පිළිබඳව සමාජ ජාල වල කෙරුණ කතා බහ නිරීක්ෂණය කරන විට ය. සූර පරිවර්තකයකු ලෙස ඔහු පාඨකයන්ගේ සිත් තුළ පැලපදියම්ව සිටිනු මම දුටුවෙමි. පරිවර්තනයක් පරිවර්තනයක් යයි නොහැඟෙන තරමට සුමට සිංහලෙන් ලියන්නට ඩීබී ට තිබූ හපන්කම විශිෂ්ටය. ඒ පරිවර්තකයා පිලිබඳ නිසි අගැයීමක් කෙරුණිද යන්න කතා කල යුතු මාතෘකාවකි.

සත්‍යය නම්, ඩීබී ගොලු හදවතේ ජයග්‍රාහී පෙම්වතාව දම්මිගේ ආදරය දිනාගෙන සිටි බව කියවෙන රසවත් ඕපාදූපය රස කර කතා කරන්නට කැමති වූ ලංකාවේ පුවත්පත් ඩීබී නම් වන පරිවර්තකයා අමතක කරදමා සිටි බව ය. ඩීබී කුරුප්පු නම් වන පරිවර්තකයා පිළිබඳව ලංකාවේ මාධ්‍ය කතා නොකළ තරම් ය. සමහර විට ඔහු ඕස්ට්‍රේලියාව වැනි දුර බැහැරක වාසය කිරීම එයට හේතුව වන්නට ඇත.

1963 සිට ඇරඹෙන පරිවර්තන චාරිකාවේ ඩීබී අතින් සිදුවුණ මේ පරිවර්තන අමතක කර දමන්නට පාඨකයනට හැකියාවක් තිබේද?
මැංචෝසන්ගේ චාරිකා
හෝචිමිංගේ සිරගෙයි දිනපොත
පිළිකා සුවය ඔබ අතමය
කයිරෝව කුඩා නගරයකි
අන්තිම උපන්දින සාදය
සංගම්කාරයාගේ මලගම
අර්ධනාරී
නිර්මාණ චිත්තරූප
දැත්තා හඳට යයි
හිරෝෂිමා දිනපොත
අන්තර්භවය
ටික්කාගේ වික්‍රමය
අර්බත් දරුවෝ 1 සිට 7
සිංහල බසින් සිදුකෙරුණ දැවැන්ත පරිවර්තනයක් වන කාණ්ඩ හතකින් යුත් අර්බත් දරුවෝ පිලිබඳව හෝ කතා කරන්නට ලංකාවේ කිසිදු මාධ්‍යයක් නොවී ය.

ඩීබී ගේ පරිවර්තනයක් පිළිබඳව ලංකාවේ පුවත්පතක් කළ එකම විචාරය ඔහු ගේ " අර්ධනාරී" පරිවර්තනය පිළිබඳව රාවයේ පළ වූ හරවත් විචාරය පමණක් ය යන්න මගේ මතකයයි. එයට මැදිහත් වන්නට ලැබීම අදත් මට මහත් සැනසීමක් ගෙන දෙන්නකි.

මගේ රසවින්දනයේ දිග පළල අනුව ඩීබී ගේ පරිවර්තන අතරින් හොඳම පරිවර්තනය අර්ධනාරී වෙයි. අර්ධනාරී නිකුත් වූ වසරේ එය සාහිත්‍ය සම්මානයට පාත්‍ර නොවූයේ මන්ද යන්න අදටත් මට ගැටළුවකි. සමහර විට ප්‍රකාශකයන් ඒ පොත විනිශ්චය සඳහා නොයැව්වා වන්නට පුළුවන. යැව්වා නම් අර්ධනාරී පරිවර්තනයට අහලකටවත් ළඟින් කියන්නට බැරි පොතකට හොඳම පරිවර්තනය සඳහා වන සාහිත්‍ය සම්මානය හිමිවන්නට හේතුවක් නැත. අර්ධනාරී පරිවර්තනයට නිසි අගැයීමක් නොලැබීම පිළිබඳව ඩීබී සිටියේද කණස්සල්ලෙනි.

ඩීබී ගේ අර්ධනාරී කියැවූ වහාම මම ඒ පොතින් පිටපතක් එවකට රාවයේ සිටි හිතවත් විමලනාත් වීරරත්නට යැව්වෙමි. කුඩා සටහනක්ද සමගින්ය.

"හිතවත් විමලේ... ඩීබී කුරුප්පු මහත්තයාගේ මේ පොත කියවා සාධාරණයක් කරන්න"

විමලනාත් අර්ධනාරී කියවා ඉතා විශිෂ්ට ලිපියක් රාවයට ලිව්වේ ය. එය කියවා කුරුප්පු මහතා මහත් සතුටට පත්විය. ඒ සතුට කෙතරම්ද යත් ලිපිය ලියූ විමල්ටත් මැදිහත් වූ මටත් ස්තුති කරන සටහන් ඔහුගේ පුවත්පත් ලිපි කීපයකත් සමහර පොත් වලත් ලියා තිබුණි.

ඩීබී ගැනත් අර්ධනාරී ගැනත් පොදුවේ පරිවර්තන ගැනත් කෙරුණ දෙවන සාකච්චාව කළේ අප මිත්‍ර මංජුල වෙඩිවර්ධන ය. මෙල්බනයේදී ය. ඒ කතාවේ කෙළවරකත් මා සිටින බැවින් එය ඊළඟට ලියමි.

මතු සම්බන්ධයි